# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1412/36 – 2005 සැප්තැම්බර් 30 වැනි සිකුරාදා – 2005.09.30

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (I) වැනි ඡෙදය — සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්.ඩී. බී. 21/78.

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 21 වැනි වගන්තිය සහ 139 වැනි වගන්ති සමඟ ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 වැනි ව්‍යවස්ථාවේ (2) වැනි ඡේදය සමඟ ද කියවිය යුතු, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27 වැනි වගන්තියේ ( 1) වැනි උපවගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපතිනි චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය මත, මේ නියමය මගින්, ශ්‍රී ලංකා රුහුණු විශ්වවිද්‍යාලය සම්බන්ධයෙන් 1984 ජනවාරි මස 27 වැනි දින අංක 281/7 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළවූ 21 වන ඡේදය යටතේ සාදනු ලැබූ නියමය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :–

(1) එකී නියමයේ (iv) වැනි ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :–

“ (iv) එකී විශ්වවිද්‍යාලයට පහත දැක්වෙන පීඨ පවරා දෙමි:–

1. කෘෂිකර්ම පීඨය
2. මානව සහ සමාජ විද්‍යා පීඨය
3. වෛද්‍ය විද්‍යා පීඨය
4. විද්‍යා පීඨය
5. ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය ” සහ

(2) එකී නියමයේ 1 වැනි තීරයේ (v) වැනි ඡේදයේ සහ II වැනි තීරයේ එහි අනුරූප සටහන්වල ඇති " විද්‍යා පීඨය " යන අයිතමයට ඉක්බිතිවම පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :–

| " *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය | ධීවර විද්‍යා සහ ජල ජීවී වගා පිළිබඳ අධ්‍යයන අංශය,<br>සාරස විද්‍යා අධ්‍යයන අංශය<br>සාගර විද්‍යා සහ සාගර භූවිද්‍යා අධ්‍යයන අංශය.". |

මේ නියමය 2005 ජනවාරි මස 1 වැනි දින සිට බලපැවැත්විය යුතු බවට සලකනු ලැබිය යුතු ය.

චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග,
ජනාධිපතිනි.

2005 සැප්තැම්බර් මස 28 වැනි දින,
කොළඹ දී ය.

10 – 270

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.